සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Provincial Department of Education - NWP**

**10 ශ්‍රේණිය** — **දෙවන වාර පරීක්ෂණය - 2023(2024)** — **11 S I**

නම: ............................................ — **බුද්ධ ධර්මය i** — **කාලය පැය තුනයි**

**සැලකිය යුතුයි,**

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 - 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1) , (2) , (3) , (4) යන පිළිතුරු වලින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. සිදුහත් කුමාරයාට ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වූ බමුණු පඬිවරයා,

1) කොණ්ඩඤ්ඤ ය. 2) කාලදේවල ය. 3) සර්වමිත්‍ර ය. 4) සුදත්ත ය.

02. බුදුරජාණන් වහන්සේ විසින් තමන් වහන්සේ දෙවියෙක්, ගාන්ධර්වයෙක්, යක්ෂයෙක්, මනුෂ්‍යයෙක් නොවන බවත් බුද්ධ නම් වන බවත් දේශනා කරනු ලැබුවේ,

1) ද්‍රෝණ බමුණා ට. 2) සොත්ථිය බමුණා ට. 3) හුහුංක බමුණා ට. 4) භාරද්වාජ බමුණා ට.

03. යශෝධරා දේවියට පුතෙකු ලද බව පණිවිඩකරු මඟින් අසන්නට ලැබුණ විට සිදුහත් බෝසතුන්ගේ මුවින් ''රාහුලෝ ජාතෝ බන්ධනං ජාතං'' යනුවෙන් ප්‍රකාශ වූයේ,

1) තම දේවියට පුතෙකු උපන් බව ඇසීම සතුට ගෙනදෙන්නක් නිසා.
2) රාහුල කුමරුට අනාගතයේ බන්ධන ඇතිවන නිසා.
3) උපන් කුමරුට රාහුල යන නම තැබිය යුතු නිසා.
4) ගිහිගෙයින් නික්ම පැවිදි වීමට බාධාවක් වන බැවිනි.

04. තමා විසින් පිළිපැද ඇස්පනාපිට මෙලොවදී ම ප්‍රතිඵල දැකගත හැකි බැවින් ධර්මය,

1) අකාලික ය. 2) සන්දිට්ඨික ය. 3) ඕපනයික. 4) ඒහිපස්සික ය.

05. තෙරුවන් ගුණ කීයද?

1) නවය කි. 2) දහය කි. 3) විසිහතර කි. 5) විස්ස කි.

06. සිතෙහි කයෙහි නිදිමත ගතිය, උදාසීනකම පවතී නම් පාඩම කළ දෙය මතකයට නොඑයි. ඒ නිදිමත බව හා උදාසීනකම හැඳින්වෙන්නේ,

1) ථිනමිද්ධ නමිනි. 2) කාමච්ඡන්ද නමිනි.
3) විචිකිච්ඡාව නමිනි. 4) උද්ධච්ච කුක්කුච්ච නමිනි.

07. භාවනාවට යොමු වන පුද්ගලයා හිඳීම, සිටීම, ඇවිදීම, ආදි ඉරියව් පැවැත්වීම අවබෝධයෙන් සිදු කළ යුතුය. එය ධර්මයේ හැඳින්වෙන්නේ,

1) ඉන්ද්‍රිය සංවර නමිනි. 2) සන්තුට්ඨිතා නමිනි.
3) සති සම්පජඤ්ඤ නමිනි. 4) කායානුපස්සනා නමිනි.

08. සිදුහත් බෝසතාණන් වහන්සේ ''සත්‍ය ගවේසීව'' සිටි සමයේ උන්වහන්සේට මුණ ගැසුණු අෂ්ට සමාපත්තිලාභි තවුසා කවුරුන් ද?

1) ආලාර කාලාම. 2) උද්දකරාමපුත්ත. 3) කාලදේවල. 4) භග්ගව.

09. ''රථය'' යන සම්මුතිය විවිධ අංගෝපාංග එක් වී සැදී ඇත්තක් මෙන් ''සත්වයා'' යන සම්මුතිය විවිධ අංග ඒක් වී සැදී ඇත. ඒ අනුව සත්වයා සැකසී ඇති අංග හඳුන්වන්නේ,

1) පංච ඉන්ද්‍රිය. 2) පංචමහා භූත. 3) පංචබල. 4) පංචස්කන්ධ ය.

10. ''දුශ්ශිලව නොසංසුන් සිත් ඇතිව අවුරුදු සියක් ජීවත් වීමට වඩා සිල්වත්ව සන්සුන් සිත් ඇතිව එක් දවසක් ජීවත් වීම ශ්‍රේෂ්ඨය'' මෙම අදහස ඇතුලත් ධම්මපද ගාථාවේ මුල්දෙපදය වන්නේ,

1) ''යෝචේ වස්සසතං ජීවේ - දුස්සිලෝ අසමාහිතො''
2) ''අචරිත්වා බ්‍රහ්මචරියං - අලද්ධා යොබ්බනේ ධනං''
3) ''සුසුඛං වත ජීවාම - වේරිනේසු අවේරිනො'
4) ''සුභානුපස්සිං විහරන්තං - ඉන්ද්‍රියේසු අසංවුතං''

11. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි ධනය විනාශ වීමට හේතුවන කරුණු අතරට අයත් නොවන කරුණක් වන්නේ මින් කුමක් ද?

1) නුසුදුසු වේලාවන්හි මංමාවත්වල සැරිසැරීම.
2) අනලස්ව කාලය ගත කිරීම.
3) පවිටු මිතුරන් ඇසුරු කිරීම.
4) නැටුම් ගැයුම් වැයුම් හි ලොල් බව.

12. ''ගෞතමයන් වහන්ස ඇතුළත අවුල්ය. පිටත අවුල්ය සත්ව ප්‍රජාව අවුලෙන් වෙලී සිටී. කවරෙක් නම් මෙම අවුල් නිරවුල් කරන්නේ ද?'' මෙම ප්‍රශ්නයට දුන් පිළිතුරෙහි ඇතුළත් ගැටලු විසදීමේ ක්‍රමය වන්නේ,
1) ත්‍රි ලක්ෂණය වැඩීම. 2) ත්‍රි විද්‍යා වැඩීම. 3) ත්‍රි වේදය වැඩීම. 4) ත්‍රි ශික්ෂාව වැඩීම.

13. සිගාලෝවාද සූත්‍රයට අනුව ගුරුවරයා විසින් ශිෂ්‍යයාට ඉටුකළ යුතු යුතුකම් අතරට අයත් නොවන්නේ,
1) පවින් වැළැක්වීම. 2) මැනවින් ඉගැන්වීම.
3) මැනවින් හික්ම වීම. 4) තම මිත්‍රයන්ට හඳුන්වා දීම.

14. උපතිස්ස පිරිවැජියා ඇසූ ප්‍රශ්නයට පිළිතුර ලෙස '' යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතෝ ආහ'' යන ගාථාව ප්‍රකාශ කළේ,
1) කොණ්ඩඤ්ඤ හිමි. 2) මහානාම හිමි. 3) අස්සජි හිමි. 4) භද්දිය හිමි.

15. බුදු දහමේ දැක්වෙන පරිදි යමක් ඇතිවීමට තවත් දෙයක් හෝ දේවල් කිහිපයක් බලපායි. මෙම අදහස ප්‍රකට වන බෞද්ධ සංකල්පය වන්නේ,

1. අහේතු අප්පච්චයවාද ය.
2) අකිරියවාද ය.
3) පුබ්බේකතහේතුවාද ය.
4) පටිච්ච සමුප්පාද ය.

16. තිදොරින් කරනු ලබන අකුසල කර්ම අතර මනෝ කර්ම ගණයට අයත් නොවන්නේ,
1) අභිධ්‍යාව. 2) විචිකිච්ඡාව. 3) මිථ්‍යා දෘෂ්ඨිය. 4) ව්‍යාපාදය.

17. පුද්ගලයෙකුගේ ප්‍රතිසන්ධිය ලබා දීමට ඉවහල් වන කර්මය හඳුන්වනු ලබන්නේ,
1) ගරුක කර්ම. 2) ආසන්න කර්ම. 3) ජනක කර්ම. 4) උපත්ථම්භක කර්ම.

18. මරණින් මතු පළමු ආත්මභවයේ හෙවත් ඊළග භවයේ දී විපාක දෙන කර්මය වන්නේ,
1) උපපජ්ජවේදනිය කර්ම. 2) දිට්ඨධම්මවේදනිය කර්ම.
3) අහෝසි කර්ම. 4) අපරාපරියවේදනිය කර්ම.

19. පස්කම් සැපතින් නික්මීම, අනුන් නොනැසීම හා අනුන්ට හිංසා නොකිරීම යන සංකල්පනාවන්ගේ යුක්ත වීම,
1) සම්මා දිට්ඨි නම් වේ. 2) සම්මා ආජීව නම් වේ.
3) සම්මා සති නම් වේ. 4) සම්මා සංකප්ප නම් වේ.

20. ආර්ය අෂ්ඨාංගික මාර්ගය ත්‍රි ශික්ෂාවට බෙදා දැක්වීමේ දී සීලය යටතට අයත් මාර්ග අංග ඇතුලත් වරණය තෝරන්න,
1) සම්මා වාචා ,සම්මා වායාම , සම්මා දිට්ඨි.
2) සම්මා වාචා ,සම්මා කම්මන්ත , සම්මා ආජීව.
3) සම්මා කම්මන්ත ,සම්මා ආජීව , සම්මා වායාම.
4) සම්මා සංකප්ප , සම්මා වාචා , සම්මා කම්මන්ත.

21. පළමු ධර්ම සංගායනාවට මුලිකත්වය ගෙන ක්‍රියා කළේ,
1) ආනන්ද හිමියන් ය.
2) සබ්බකාමී හිමියන් ය.
3) මහා කාශ්‍යප හිමියන් ය.
4) පාර්ශව හිමියන් ය.

22. ත්‍රිවිධ රත්නය කෙරෙහි ගුණ නුවණින් දැන ඇතිකරගන්නා පැහැදීම ධර්මයේ හැඳිවන්නේ,
1) අමූලිකා ශ්‍රද්ධාව ලෙස යි..
2) අවෙච්ඡපසාදය ලෙස යි.
3) භක්තිය ලෙස යි.
4) සල්ලේඛ ප්‍රතිපදාව ලෙස යි.

23. දුගී පවුලක උපත ලැබුවද ඉහළ රූප ශෝභාව හේතුවෙන් වාසනාවන්ත ජීවිතයක් ගත කළ හැක්කේ,
1) ගති සම්පත්තියෙ නි.
2) කාල සම්පත්තියෙ නි.
3) ප්‍රයෝග සම්පත්තියෙ නි.
4) උපධි සම්පත්තියෙ නි.

24. බුදුරජාණන් වහන්සේ ඉච්ඡානංගල වනයේ දී දේශනා කරන ලද සූත්‍ර දේශනාව වන්නේ,
1. අම්බට්ඨ සූත්‍ර ය.
2) වේදනා පරිග්‍රහ සූත්‍ර ය.
3) තේවිජ්ජ සූත්‍ර ය.
4) මහා සීහනාද සූත්‍ර ය.

25. '' මේ භූමි භාගය ඉතා රමණීය යි. වන ලැහැබ ප්‍රසාදජනක යි. සුදු වැලිතලා මැදින් ගලන නදිය සිත් සනසන සුලුය.'' ලෙස බුදුන් වහන්සේ අරියපරියේසන සූත්‍රයෙන් වර්ණනා කළ නදී තීරය වන්නේ,
1) අනෝමා ගං තීරය.
2) අජකරණී නදිය.
3) නේරංජනා නදිය.
4) ගංගා නදිය.

26. '' දානං සීලං පරිච්චාගං'' යන ගාථාවෙන් විස්තර වන්නේ,
1) දස සක්විතිවත්.
2) දස රාජ ධර්ම.
3) සතර සංග්‍රහ වස්තු.
4) දස පින් කිරියවත්.

27. මොග්ගලීපුත්ත තිස්ස මහරහතන් වහන්සේ සම්පාදනය කර අභිධර්ම පිටකයට එක් කරනු ලැබුවේ,
1) පට්ඨානප්පකරණ ය.
2) යමකපකරණ ය.
3) විභංගපකරණ ය.
4) කථාවත්ථුප්පකරණ ය.

28. ''උඩගු නොව මහණ'' යන වචන තුන තම පිවිසුම් දොරටුවේ ලියා අලවා තබන ලද භික්ෂූන් වහන්සේ වන්නේ,
1) වැලිවිට සරණංකර හිමි.
2) වාරියපොල සුමංගල හිමි.
3) ආනන්ද හිමි.
4) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි.

29. ''ආරභථ නික්ඛමථ - යුඤ්ජථ බුද්ධ සාසනේ '' යන ගාථා පාඨය සඳහන් සූත්‍රය වන්නේ,
1) දම්සක් පැවැතුම් සූත්‍රය.
2) මහා පරිණිබ්බාණ සූත්‍රය.
3) කරණීයමෙත්ත සූත්‍රය.
4) අරුණවතී සූත්‍රය.

30. වැලිවිට සරණංකර සංඝරාජ හිමියන් රචනා කළ ග්‍රන්ථ අතරට අයත් නොවන ග්‍රන්ථය වන්නේ,
1) මුණිගුණ අලංකාර ය.
2) බුදුගුණ අලංකාර ය.
3) සතර බණවර සන්න ය.
3) සාරාර්ථ සංග්‍රහ ය.

31. බහුජාතික බහුආගමික සමාජයක් තුළ අන්‍ය ආගම් වලට ද ගරු කරමින් ස්වකීය අනන්‍යතාව තහවුරු වන පරිදි ජීවත් වීම,
1) සමානාත්මතාව නම් වේ.
2) සහජීවනය නම් වේ.
3) ජාත්‍යාලය නම් වේ.
4) සමජීවිකතාව නම් වේ.

32. පරලොවක් නැත යන පිළිගැනීම මත මෙලොව වශයෙන් හැකිතාක් සැප විඳීමට ඇති ආශාව,
1) විභව තණ්හාව යි.
2) කාම තණ්හාව යි.
3) භව තණ්හාව යි.
4) රස තණ්හාව යි.

33. පාලකයෙකු තම රටවැසිහාගේ යහපත සඳහා කාලය, ශ්‍රමය , ධනය ආදිය කැප කිරීම දසරාජ ධර්මයේ හඳුන්වන්නේ,
1) දානය.
2) සීලය.
3) පරිත්‍යාගය.
4) තපස.

34. දෙවන හා තෙවන ධර්ම සංගායනා සඳහා අනුග්‍රහය දැක්වූ පාලකයන් නිවැරදිව සඳහන් වන්නේ,
1) අජාසත්ත හා අශෝක.
2) කාලාශෝක හා ධර්මාශෝක.
3) අජාසත්ත හා කාලාශෝක.
4) ධර්මාශෝක හා අජාසත්ත.

35. දුටුගැමුණු රජු ඉදි කරනු ලැබූ ආගමික ගොඩනැගිලි පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

1) ලෝවාමහාපාය, රුවන්වැලි සෑය, අභයගිරිය.
2) රුවන්වැලි සෑය, මිරිසවැටිය, අභයගිරිය.
3) රුවන්වැලි සෑය, ථූපාරාමය, මිරිසවැටිය.
4) මිරිසවැටිය, රුවන්වැලි සෑය, ලෝවාමහාපාය.

36. බුදු දහම ස්ථාපිත වීමත් සමඟ ලංකාවේ ඉදිකළ මුල්ම ස්තූපය වන්නේ,
1) ථූපාරාම දාගැබ. 2) ගිරිහඬු සෑය. 3) මහියංගණ චෛත්‍ය. 4) කැළණිය චෛත්‍යය.

37. තමා උපමා කර අනුන් ගැන සිතන්නට උගන්වන ධර්ම පරියාය වන්නේ,
1) ලෝකාධිපති ධර්මය යි. 2) අත්තාධිපති ධර්මය යි.
3) ධම්මාධිපති ධර්මය යි. 4) අත්තූපනායික ධර්මය යි.

38) දළදා වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කරවන අවස්ථාවේ ශ්‍රී ලංකාවේ පාලකයා වූයේ,
1) කිත්සිරිමෙවන් රජු. 2) මහසෙන් රජු.
3) පළමු විජයබාහු රජු. 4) පළමු පරාක්‍රමබාහු රජු.

39) ලොව සියල්ල මොහොතින් මොහොත වෙනස් වන බවත් කිසිවක ස්ථිරසාර පැවැත්මක් නොමැති බවත් සඳහන් ධර්මතාව වන්නේ,

1) ආත්ම. 2) දුක්ඛ. 3) අනිත්‍ය. 4) අනාත්ම.

40. පන්සිය පනස් ජාතක පොත් වහන්සේ ලියවුණේ,

1) දඹදෙණි යුගයේ. 2) මහනුවර යුගයේ.
3) කුරුණෑගල යුගයේ. 4) අනුරාධපුර යුගයේ.

* * * * * *

## II කොටස

- පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක්ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

01. i. ''මෙවන් පුතෙකු ලද මවක් පියෙක් නිවුණෝ වෙති'' වශයෙන් නිබ්බුත පද පවසනු ලැබුවේ කවුරුන් විසින් ද?

ii. බුදු දහමේ ඉගැන්වෙන ප්‍රධාන භාවනා ක්‍රම දෙක මොනවා ද?

iii. ''සමවායෝ එව සාධු'' යන්නෙහි අර්ථය ලියන්න.

iv. බුදු දහමේ දැක්වෙන සිරිත් හා විරිත් යන්නෙහි කෙටි අදහස ලියන්න.

v. ''ඉමස්මිං සති ඉදං හොති, ඉමස්ස උප්පාදා ඉදං උපපජ්ජති'' මෙම පාඨයේ අදහස ලියන්න.

vi. බුදුන් වහන්සේ පළමු වස් කාලය හා දහවන වස් කාලය ගත කළ ස්ථාන ලියන්න.

vii. කයින් සිදුවන කුසල කර්ම වලින් දෙකක් ලියන්න.

viii. සතර මහා භූත නම් කරන්න.

ix. ශ්‍රද්ධාවේ ප්‍රභේද දෙක නම් කරන්න.

x. දුටුගැමුණු මහරජතුමා විසින් ඉදි කරනු ලද ස්තූප දෙක නම් කරන්න.

02. i. ''අනුසෝතගාමී'' හා ''පටිසෝතගාමී'' යන වචන දෙකෙහි අර්ථය ලියන්න.

ii. බුදුසිරිත පද්මාකාර ලෙස හඳුන්වන්නේ ඇයිදැයි පහදන්න.

iii. බුදුරාජණන් වහන්සේගේ පද්මාකාර ජීවිතයෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ ගෙනහැර දක්වන්න.

03.i. ''උට්ඨානවතෝ සතිමතෝ'' යන ධම්මපදය ගාථාව සම්පූර්ණ කර ලියන්න.

ii. එම ගාථාවේ තේරුම ලියන්න.

iii. ''ධම්මපදය ශිෂ්‍ය ජීවිතයට වටිනා ආදර්ශ සපයන ග්‍රන්ථයකි.'' විමසන්න.

04.i. චතුරාර්ය සත්‍යය අතරින් දෙකක් නම් කරන්න.

ii. ඉහත (1) හි නම් කළ එක් කරුණක් පැහැදිලි කරන්න.

iii. දෛනික ජීවිතයේ අප මුහුණ දෙන ගැටලු විසඳා ගැනීමට චතුරාර්ය සත්‍යය උපයෝගී වන ආකාරය පැහැදිලි කරන්න.

05.i. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් පරිදි උඩ දිශාවට හා යට දිශාවට උපමා කරනු ලැබුවේ කවුරුන් ද?

ii. ඉහත (1) හි සඳහන් යට දිසාව පිළිබඳ හැඳින්වීමක් කරන්න.

iii. තෘප්තිමත්, සාධාරණ සමාජ ජීවිතයක් ගත කිරීම සඳහා අන්‍යෝන්‍යය යුතුකම් ඉටුකිරීම තුළින් හැකිවෙයි. විමසන්න.

06.i. තෙවැනි ධර්ම සංගායනාව පැවැත්වීමට ඉවහල් වූ කරුණු දෙකක් ලියන්න.

ii. එම සංගායනාව පැවැත්වූ ස්ථානය, අනුග්‍රහය දුන් පාලකයා හා මූලිකත්වය ගත් මහරහතන් වහන්සේ නම් කරන්න.

iii. ''බුදු දහමේ දේශාන්තර ව්‍යාප්තිය සිදු වූයේ තෙවනි ධර්ම සංගයායනාවේ ප්‍රතිඵලයක් ලෙසය'' පැහැදිලි කරන්න.

07. පහත මාතෘකා ඇසුරින් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

i. වැලිවිට සරණංකර හිමි.
ii. ත්‍රි ලක්ෂණය.
iii. ස්තූපය.
iv. බුදුරජාණන් වහන්සේගේ තාදී ගුණය.